# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **2.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **5.00 යි.**

**2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 4/2011.

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** (1) මේ පනත 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

(2) මේ පනතේ විධිවිධාන, සියලු කාර්ය සඳහා 2010 නොවැම්බර් මස 19 වන දින ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

**2.** 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත එහි 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයේ “රේගු බද්ද අධිභාරය, සෙස් බදු, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ එකතු කළ අගය මත බදුවල මුළු එකතුවට සමාන මුදලක්” යන වචන වෙනුවට “රේගු බදු, සෙස් බදු සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු යන බදුවල මුළු එකතුවට සමාන මුදලක්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1989 අංක 13 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 005591 —3,350 (2011/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.